ඇමරිකා එක්සත් ජනපදයේ රූ රැජිණ ලෙස 2019 දී කිරුළු දිනූ චෙස්ලි ක්‍රිස්ට් පසුගිය දිනක මිය යාම පිළිබඳ පුවතට ජාත්‍යන්තර මෙන්ම දේශීය මාධ්‍ය ඔස්සේ ද පුළුල් අවධානයක් ලැබී තිබිණි. එහිදී, එම පුවත වාර්තා කිරීමේදී දේශීය මාධ්‍ය තුළ කඩවී තිබූ මාධ්‍ය මාර්ගෝපදේශයන් පිළිබඳ සංසන්දනාත්මක විමසා බැලීමක් අපි මින් පෙරද සිදුකළෙමු. මෙම දිවි තොර කරගැනීම සහ චෙස්ලි ක්‍රිස්ට්ගේ ජීවිතය පිළිබඳ අරුණ පුවත්පතෙහි (පෙබරවාරි 06, 2022) පළවූ තවත් ලිපියක් සහ එතුළ කඩවී තිබූ දිවි තොර කරගැනීම් වාර්තා කිරීම පිළිබඳ මාධ්‍ය මාර්ගෝපදේශයන් කිහිපයක් අපගේ නිරීක්ෂණයට ලක් විය.

1) පුරා පිටුවක් තුළ, මෙම ලිපිය ප්‍රමුඛතාවයකින් යුතුව පළවී තිබුණි. සමේ පැහැය පදනම් කරගත් කොන්කිරීම් වැනි සමාජ ගැටලු පිළිබඳ සාකච්ඡා කරන මෙවැනි ප්‍රස්තුතයකදී එවැනි ලිපියක් ප්‍රමුඛතාවයෙන් යුතුව පළ කිරීමේ අවශ්‍යතාවයක් ඇති බව පිළිගත යුතුවේ. එසේම, දිවි තොර කරගැනීමකට පාදක වන කරුණු වැනි වඩාත් ගැඹුරු මානසික සෞඛ්‍ය ප්‍රශ්නද මෙම ලිපිය තුළ සාකච්ඡාවට බඳුන් වේ. එවැනි අවස්ථාවල, ප්‍රමුඛත්වය සාධාරණීකරණය කළ හැකි වුවත්, ඇය දිවි තොර කරගත් ආකාරය සහ ස්ථානය පිළිබඳ තොරතුරු වඩාත් අවධානය යොමු වන ලෙස පළ කිරීම ප්‍රශ්නකාරී නොවේදැයි පාඨක අප ප්‍රශ්න කළ යුතු වෙයි.

ද ගාඩියන් (The Guardian, පෙබරවාරි 06, 2022) වැනි ජාත්‍යන්තර මාධ්‍ය තුළද චෙස්ලිගේ සමේ පැහැය සහ ඇගේ දිවි තොරකරගැනීම පිළිබඳ ලිපිය පළ වුවද, ඒවායේ ඇය දිවි තොරකරගත් ආකාරය පිළිබඳ දීර්ඝ විස්තර ඇතුළත් නොවුණි.

3) චෙස්ලි ක්‍රිස්ට් මිය යෑමට පෙර තැබූ සමාජ මාධ්‍යජාලා පණිවුඩ සහ ලියූ බවට පැවසෙන ලිපි පුවතට යොදාගත යුතුව තිබුණේදැයි ප්‍රශ්න කළ යුතු වේ. විශේෂයෙන්ම ඇය ජනප්‍රිය පුද්ගලයෙක්, තරුවක් වීම නිසාද, එවැනි පණිවුඩ ඔස්සේ දිවි තොර කරගැනීමේ නැඹුරුතාවක් ඇති අයෙකු ඒ හා තමන්ව අනන්‍ය කරගැනීමටත්, එයද අනුකාරක දිවි තොර කරගැනීම් ඇතිවීමටත් හේතු විය හැකි බැවිනි.

4) මෙම පුවත පළ කළ ජාත්‍යන්තර මාධ්‍ය බොහෝමයක් පාහේ මෙම පුවත සමඟින් හදිසි උපකාරක අංක පළ කිරීමට ප්‍රවේසම් වී තිබුණි. මෙම ලිපිය සමගින්ද හදිසි උපකාරක අංක පළ කළේ නම්, එය දිවි තොරකරගැනීමේ නැඹුරුවක් ඇති අයෙකුගේ දිවි ගලවා ගැනීමට පිටුවහලක් වනු ඇත.

මේ පිළිබඳ ඔබේ අදහස් මොනවාද?

හදිසි උපකාරක අංක:
*1333-CCCline
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926

මූලාශ්‍ර:
https://apps.who.int/.../WHO-MSD-MER-17.5-eng.pdf...
https://media.samaritans.org/.../Guidance_for_reporting...
https://www.theguardian.com/.../who-was-cheslie-kryst...